Journal of Intangible Cultural Heritage

JICH (2024), Volume 3 (I)

# An Inquiry into the Health Principles and Their Uses Made by the Ancients for Social Compassion (Based on Rajarata Civilization)

## සමාජ සහකම්පනය උදෙසා පැරැන්නන් විසින් සම්පාදිත ප්‍රතිපත්ති හා ඒවායේ උපයෝගීතාව පිළිබඳ විමසුමක් (රජරට සභ්‍යත්වය ඇසුරෙන්)

H. M. N. M. Ekanayaka

Graduate School of Southwest University, Chongqing, China
*nimeshaekanayake65@gmail.com*

***Abstract***

*Since ancient times, health has been given priority among humans. This research aims to identify the health policies made by the ancients during the Rajarata civilization period. The research problem here is how the developed health policies were used for social solidarity and what is their utility. The historical research method was used as the research method here. Sourced facts confirm that the ancient Sri Lankan people also thought of health as an absolute profit. If the health system is of high quality, it is an indication that society at that time acted with compassion. Traditional folk beliefs also prevailed among the people at this time. Accordingly, the ancients strongly believed that diseases are caused by angering the forces called Va-Pit-Sem and other beliefs. It is a mandatory factor to have medical facilities in a state in case of emergencies such as epidemics, pneumonia and war. Therefore, based on these factors, the ancients worked to support the government in making health policies and to raise the health sector. It is stated in the Mahavamsa that ancient medicine was concerned with medical services such as various methods of treatment, style medicine, psychological treatment etc. According to the Mahavamsa, King Dutugemunu has fondly remembered the medical facilities he provided for the public as one of the highest services he did at the time of his death. King Buddhadasa played a special role in the ancient medicine service. The king, who worked with great kindness and compassion to cure the sufferings of his people by performing the affairs of the state well, was a physical and mental doctor who understood it well. During the Polonnaruwa era, King Maha Parakramabahu showed special interest in improving the health of the country's inhabitants. In the continuous history of several centuries, the implementation of the state policies applied by the rulers of the Rajarata Civilization period also on health shows the nature of formal governance. It can also be recognized that Sri Lankan society is not only concerned with public health but also with compassion towards animals and implemented those health policies.*

***Key Words:*** *Ancients, Policy, Medicine, Health, Compassion*

## 1. හැඳින්වීම

අතීතයේ පටන් මිනිසා නිරෝගිකමට මුල් තැන දී තිබේ. 'ආරෝග්‍යා පරමා ලාභා' යන බුද්ධ දේශනය අනුව නිරෝගිකම උතුම් සුවයකි. එබැවින් පුරාතන ලාංකේය ජනයා ද නිරෝගිකම පරම ලාභයක් ලෙස සිතූ බව කරුණු ඇසුරෙන් තහවුරු වේ. 3වන දී බුදු දහම ලැබීමත් සමඟ මෙරට සෑම ක්ෂේත්‍රයක ම දියුණුව ඇති වූ අතර සිංහල රජවරුන්ගේ පාලනය යටතේ ඉතා තියුණු විද්‍යානුකූල වූ ක්‍රමයක් මෙරට පැවතුණු බව ද , මැදිරිගිරිය ආදී රෝහල් හා සෙල්ලිපිවලින් වංශකථාගත තුළින් ද අනාවරණය වේ. ඒ අනුව පුරාතනයේ පැරැන්නන් තිබූ විශිෂ්ට ගණයේ සේවාවක් මෙරට තිබූ බවට සාධක දක්නට ලැබේ. මෙරට ක්ෂේත්‍රය ආර්ය ජනාවාස ව්‍යාප්තිය සමඟ භාරතීය ආභාසය ඇති ව වර්ධනය වූ බව සිතිය . පද්ධතිය උසස් තත්ත්වයක පැවතීමට නම් එකල සමාජය සහකම්පනයෙන් යුතු ව ක්‍රියා බව පෙනේ. වෙදකම පිළිබඳ භාරතීය ජනයා තුළ පැවතියේ දැනීමක් බව වේද ග්‍රන්ථයන්ගෙන් තොරතුරු අනාවරණය වේ. හයවන පමණ වන විට බුදු සමය නිසා ලැබුණු ආභාසය ද භාරතීය වෛද්‍ය විද්‍යාව කෙරෙහි විශාල රුකුලක් විය. විනය මහාවග්ගයේ භේසජ්ජක්ඛන්දකය අනුව ආරක්ෂා කර ගැනීම පිළිබඳ උපදෙස් ද විවිධ රෝග සඳහා වන ප්‍රතිකාර විධි ද බුදුන් වහන්සේ ශ්‍රාවකයන්ට ලබා දුන් බව සඳහන් වේ. එපමණක් නොව ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය වූ මූලික කරුණු වශයෙන් ආහාර සප්පාය, විහරණ සප්පාය, උතු සප්පාය, පුද්ගල සප්පාය, අජ්කධාය සප්පාය යනුවෙන් කරුණු පහක් බුදු සමය පෙන්වා දී ඇත. ඉන්දියාවේ මුල් ආයුර්වේද ග්‍රන්ථ දෙකක් වන චරක සංහිතාවේ හා සුශ්‍රැත සංහිතාවේ ද මේ පිළිබඳ සඳහන් ය. ඒ අනුව චරක සංහිතාවේ පාද හා මළ මාර්ග සමූහය නිතර සේදීමෙන් ද කැපීමෙන් හා පිරිසිදු කිරීමෙන් ආයු වැඩෙන බව ද ගත සිත පිරිසිදු වන බව ද දක්වා තිබේ (සිරිවීර, 2004: 261 පිට). අශෝක ලිපිවලට අනුව 'මනුෂ්‍ය චිකිත්සා හා පශු චිකිත්සා' යන වචන අනුව මිනිසාට මෙන් ම සතුන්ට ද වෛද්‍ය ප්‍රතිකාර කළ බව පැහැදිලි වේ. මෙම වෛද්‍ය ක්‍රමය මහින්දාගමනයෙන් පසුව ලංකාවේ ප්‍රචලිත වූ බව පෙනේ. කෞටිල්‍යය අර්ථ ශාස්ත්‍රය අනුව ඉන්දියාවේ ප්‍රධාන නගරවල සෞඛ්‍යය පරිපාලන කටයුතු පිළිබඳ නීතිරීති රාශියක් සඳහන් ය. ඒ අනුව වීදියකට කුණු කසල දැමීම, වීදියක කසල එක් රැස් වීමට ඉඩ හැරීම, සතුන්ගේ මළ සිරුරු වීදිවල දැමීම, සොහොන් බිම්වලින් පිටත මිනී ආදාහනය දඬුවම් ලැබිය යුතු වැරදි ලෙස දක්වා තිබේ. මෙම අනුසාරය ලාංකේය පාලකයන් ද භාවිත කරන්නට ඇත. ඒ අනුව මේ පිළිබඳ ප්‍රතිපත්ති සමාජ සහකම්පනය ඇති කිරීම උදෙසා කටයුතු කරන්නට ඇතැයි සිතිය හැකි ය. එබැවින් වෙදකම පිළිබඳ භාරත සමාජයෙන් පැමිණි ජනතාව තුළ වූ දැනුම හා දේශීය ජනතාව තුළ වූ පාරම්පරික දැනුම නිසා නිසා අතීතයේ පැවති උසස් වෛද්‍ය සේවාවක් මෙරට දක්නට ලැබිණි. මෙකල ජනයා අතර සාම්ප්‍රදායික ජන විශ්වාස ද පැවතිණි. ඒ අනුව පැරැන්නන් වා-පිත්-සෙම් යන බලවේග කෝප වීම හා අනෙකුත් විශ්වාස මත රෝග ඇති වේ යයි ප්‍රබල ලෙස විශ්වාස කර තිබේ. ඇතැම් අවස්ථාවල රෝග පීඩාවන් රාජ්‍යය පරිහානිකර තත්ත්වයක් බවට පත් වීමට ද හේතු වූ බව හඳුනා ගත හැකි ය. වසංගත රෝග, වාත රෝග, යුද කටයුතු වැනි හදිසි අවස්ථා තත්ත්වයන්හි දී ප්‍රතිකාර ක්‍රමයන් රාජ්‍යයක් තුළ පැවතීම අනිවාර්ය සාධකයකි. එබැවින් මෙවැනි සාධක මුල් කර ගනිමින් පැරැන්නන් සෞඛ්‍යය කෙරෙහි ද ප්‍රතිපත්ති සම්පාදනයට අනුග්‍රහය දැක්වීමට හා ක්ෂේත්‍රය නඟා සිටවීමට කටයුතු කරන ලදී.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙහි දී යොදා ගන්නා ලද පර්යේෂණ ක්‍රමවේදය ඓතිහාසික පර්යේෂණ . දත්ත සපයා ගැනීම සඳහා පුස්තකාල අධ්‍යයනය සිදු කරන ලදී. රජරට සභ්‍යත්ව අවධියේ හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයත් අනුරාධපුර හා යුගයන්ට අදාළ ව මෙතෙක් පළ වී ඇති ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රයත් කොළඹ සහ මහනුවර රාජ්‍ය ලේඛනාගාරයන්හි තැන්පතු ලේඛන ආදී මූලාශ්‍රය රැසක් අධ්‍යයනයට දත්ත සන්සන්දනාත්මකව සහ

විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කරමින් නිගමනවලට එළඹීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය වේ.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

### 3.1 පැරැන්නන් විසින් සම්පාදිත ප්‍රතිපත්ති හා ඒවායේ උපයෝගීතාව

පැරණි වෛද්‍ය සේවාව හා සම්බන්ධ වූ විවිධ චිකිත්සා ක්‍රම, වෛද්‍ය ක්‍රම, නහර විද රුධිරය ඉවත් කිරීම, වමනය, වාතාබාධ, වසංගත රෝග, විස්සෝප සමනය, විෂ කැවූ ආයුධවලින් සිදු වන තුවාල සුව කිරීම, විෂ මිශ්‍ර දියර වර්ග නිසා තුවාල සුව කිරීම, පිලිස්සීමෙන් සුව කිරීම්, උණ රෝග, කුෂ්ඨ රෝග, මානසික ප්‍රතිකාර ආදී වූ වෛද්‍ය සේවාවන් කෙරෙහි සැලකිලිමත් වූ බව මහාවංශයේ සඳහන් වේ. මේ අනුව බෙහෙත් තෙල් වත් කිරීම, බෙහෙත් ඔරුවක බහා තැබීම, ජන්තාඝර භාවිතය ආදිය මෙකල ප්‍රතිකාර කළ ක්‍රමවේද ලෙස හඳුනා ගත හැකි ය. එහි මානසික රෝගීන් පවා හඳුනාගෙන ඔවුන් සුවපත් කිරීමේ දක්ෂතා තිබූ මනෝ චිකිත්සක රජවරුන් සඳහන් වේ. ජනතාවට පහසුකම් සපයා දීම පිළිබඳ මෙරට බොහෝ රජවරු උනන්දුවක් දක්වා ඇති බව පෙනේ. ස්වස්ථතාව පිළිබඳ සඳහන් වන්නේ පණ්ඩුකාභය රජ දවස ය. අනුරාධපුර යුගයේ දී පණ්ඩුකාභය රජු ජනතාවගේ පහසුකම් පිළිබඳ සැලකිලිමත් වූ බව මහාවංසයේ දක්වේ "...සිවිකා සොත්ථිසාලාච අකාරයි තහිං..." (විමලජෝති හිමි, 2003, 10 පරි: 102 ගාථාව). ඒ අනුව අනුරාධපුර නගරය නිර්මාණය කිරීමේ දී එහි සනීපාරක්ෂාව පිළිබඳ විශේෂ වැඩපිළිවෙළක් සංවිධානය කළ බව පැහැදිලි වේ. එහි සඳහන් අන්දමට අභිනව නගරයෙහි සිවිකාශාලා සහ සොත්ථිශාලා අතර නගර පන්සීයක් ද කසල එකසිය පනස් දෙනෙක් ද මළ සිරුරු ඉවත් කිරීමට එකසිය පනස් දෙනෙක් ද යොදන . මෙහි සඳහන් වන සිවිකා ශාලාවට ප්‍රසූතිකාගාරය වශයෙන් ද සොත්ථිශාලාව රෝහලක් වශයෙන් ද මහාවංශ ටීකාවේ විස්තර කොට තිබේ (මහාවංස ටිකාව, 296). ඉහත සඳහන් පරිදි නගරයේ සනීපාරක්ෂාව ගැන උනන්දු වූ රජ කෙනෙකු විසින් මාතෘ නිවාස හා ආරෝග්‍යශාලා ඉදි කරනු ලැබීම පුදුමයක් නොවේ. ලෝක වෛද්‍ය ඉතිහාසයේ රෝහල් පිහිටුවීමේ ගෞරවය හිමි වන්නේ පණ්ඩුකාභය රජතුමාට ය. සිවිකා නමින් හඳුන්වන්නේ ගර්භනී ස්ත්‍රීන්ට ප්‍රසූතිය සඳහා සාදවන ලද ශාලාවත් සොත්ථි ශාලා නමින් පොදු ජනයා සඳහා ලද ආරෝග්‍ය ශාලාවත් ය. මේ අනුව බුදුසමය පැමිණීමට පෙර රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා පහසුකම් සැලසීම කෙරෙහි රජු හා ජනතාව අතර අවබෝධයක් තිබූ බවත් මුල් අවධියේ වුවත් ප්‍රතිපත්ති මැනවින් ක්‍රියාවට නැංවීමට පැරැන්නන් සමත් වූ බවත් පැහැදිලි වේ.

පණ්ඩුකාභය පසු වෛද්‍ය කටයුතු ගැන සඳහන් වන්නේ දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ දී ය. අශෝක අධිරාජ්‍යයා විසින් රජු වෙත එවන ලද තුටු පඬුරු අතර ආයුර්වේදයෙහි තිපල ලෙස සලකන අරලු, බුලු, නෙල්ලි ද වූ බව මහාවංශයේ සඳහන් වේ. මෙය එකල ඉන්දීය ආයුර්වේද ක්‍රමය ලංකාවේ ප්‍රචලිත වූ බවට සාධක සපයයි. ඒ අනුව දේවානම්පියතිස්ස කාලයේ සිට ම මේ සම්බන්ධ ව ප්‍රතිපත්ති බවට සාධක සපයයි. පිච්චන්දියාව ශිලා ලේඛනය අනුව ගොබුතිය බ්‍රාහ්මණයා දෙවනපැතිස් රජුගේ ගුරුවරයා ලෙස ද වෛද්‍යවරයා ලෙස ද හඳුන්වා දී තිබේ. ඒ අනුව දෙවැනි සියවසට අයත් එම ලිපියේ වෛද්‍යාචාර්ය බමුණකු ගැන සඳහන් වේ. මෙම ලිපියෙන් ගාමිණී තිස්ස මහ රජුගේ වෛද්‍යවරයා වූ ගොබුතිය නම් බමුණාගේ ලෙන සංඝයාට පිදූ බවයි. ඒ අනුව මේ යුගයට අයත් බ්‍රාහ්මී සෙල්ලිපිවලින් වෙජ නමින් හඳුන්වනු ලැබූ වෛද්‍යවරු සිටි බව අනාවරණය වේ. පළමු සියවසට අයත් රාජාංගනයෙන් ලැබී ඇති බ්‍රාහ්මී අක්ෂර ලිපියක ද ...උපසක වෙජ විතහ පුත මටිගබතිය ලෙණෙ සගශ... යනුවෙන් වෙදකුගේ පුත්‍රයකු ලෙනක් පූජා කළ බව සඳහන් වේ. මේ යුගයේ දී භික්ෂූන් වහන්සේලාට ලෙන් පිදූ අය සමාජයේ උසස් සිටි අය බව පෙනේ. එබැවින් තනතුරු දැරූ අය ද සමාජයේ උසස් මට්ටමේ සිටි පුද්ගලයන් බව පැහැදිලි ය.

සිතුල්පව්ව විහාරයේ භික්ෂූන්ගේ ප්‍රයෝජනය සඳහා බෙහෙත් පිණිස එක් දිනකට කහවණු 2ක් බැගින් වෙන් කළ බව 2වන සියවසට අයත් මහසිතුල්පව් පර්වත ලිපියක ...එක දිවස දො කහවණ බගිනි විතලපවත විහරහි බිකුසගහටය බෙසජවට කොටු දිනි... යනුවෙන් සඳහන් වේ. මේ අනුව විහාරවල වසන භික්ෂූන් වහන්සේලාගේ සෞඛ්‍යය සංරක්ෂණය සඳහා ද ක්‍රමානුකූල වෛද්‍ය සේවාවක් තිබූ බව පැහැදිලි වේ. දුටුගැමුණු රාජ්‍යය සමයේ ද (ක්‍රි.පූ 161-ක්‍රි.පූ 137) එතුමා ලෙඩුන් සඳහා ස්ථාන දහ අටක් පිහිටුවා ලවා ගිලානෝපස්ථාන කරවූ බව වංශ සඳහන් වේ. එතුමා සිව් අඟුල් දිග වැල්මී දඬු ධර්මභාණකයන්ට පිරිනැමූ බව ද වැල්මී ස්වරභංග පිපාසාප වැනි රෝග සඳහා ඖෂධ වශයෙන් යොදා ගත් බවත් එහි සඳහන් වේ (මහාවංශය, 32 පරි 38-39ගාථා). මහාවංශය අනුව දුටුගැමුණු රජු මරණාසන්න අවස්ථාවේ තමා කළ සේවාවන් අතර මහජනයා වෙනුවෙන් සැපයූ පහසුකම් මහත් සතුටින් සිහිපත් කර ඇත. ඔහු තැනක නියම කරන ලද්දා වූ ගිලනුන් සඳහා වන ආහාර බෙහෙත් පහසුකම් සැලසී ය.

පහසුකම් ඉතා දියුණු මට්ටමින් පැවති බවට වංශකථාවල සඳහන් වන්නේ බුද්ධදාස රජුගේ කාලයේ දී ය. එතුමා දක්ෂ වෛද්‍යවරයෙකු බවත් වෙදකමින් හාස්කම් දැක්වූ බවත් මහාවංශයේ සඳහන් වේ. ඒ අනුව බුද්ධදාස රජතුමා පෙර පැරණි සේවය වෙනුවෙන් විශේෂ කාර්යභාරයක් ඉටු කරන ලදී. පාලන කටයුතු මැනවින් ඉටු කරමින් තම ජනතාව මුහුණපාන රෝ දුක් සුව කිරීම සඳහා මහත් කරුණාවෙන් සහකම්පනයෙන් කටයුතු කළ රජු ඒ පිළිබඳ මැනවින් අවබෝධ කරගත් කායික හා මානසික වෛද්‍යවරයෙකි. ඒ පිළිබඳ දක්වන මහාවංසය ''රජකමත් වෙදකමත් එක හා සමාන සම්මානනීය සේවාවක් ලෙස පැරැන්නෝ සැලකූහ. බුද්ධදාස රජතුමා මේ උසස් පදවි දෙකම එක සේ වර්ණවත් කළ රජ කෙනෙකි'' යනුවෙන් දක්වා තිබේ (මහාවංශය, පරි 37:110-112 ගාථා). මිනිසුන් වෙත සහකම්පනයෙන් ක්‍රියා කළ එතුමා වරක් එක්තරා රෝගියෙකුගේ හිස් කබල පලා ශල්‍ය කර්මයක් කොට සුවපත් කිරීම පිළිබඳ පුවතක් සඳහන් වේ. තව ද එක්තරා භික්ෂූන් වහන්සේ නමක් ථූපවත්තික නම් ගම්මානයේ දී සහිත කිරි කෝප්පයක් හෙයින් උදරය තුළ පණුවන් වර්ධනය වීම නිසා අශ්ව රුධිරය පොවා වමනය කරවා සුවපත් කිරීමේ පුවතක් ද එහි සඳහන් වේ. වර්තමානයේ දියුණු පවතින බෙහෙත් ශරීරගත කිරීමේ ක්‍රමය එකල දියුණු තත්ත්වයක පැවති බවට මෙමඟින් පැහැදිලි වේ. ඇතැම් විට ඉහත කී තෙරුන් වහන්සේට පානය කරන්නට අශ්ව රුධිරය ගන්නට ඇත්තේ අශ්වයෙකුගේ ශරීරයට බෙහෙත් විදීමෙන් පසුව වන්නට ඇත. එසේ ම රජු කෙරෙහි වෛරයෙන් සිටි කුෂ්ඨ රෝගියෙකු සුවපත් කොට තමාට හිතවත් අයකු ලෙස ජීවත් වීමට සැලැස්වීමෙන් පෙනෙන්නේ බුද්ධදාස රජතුමා ගතට මෙන් ම සිතට ද වෙදකම් කිරීමේ සමත්කමක් ඇති මානසික රෝග විශේෂඥයෙකු බවයි. එම කුෂ්ඨ රෝගියාට යෞවන ස්ත්‍රීන් ලවා ආදරය කරුණාව දක්වන ප්‍රතිකාර කර වූ බව මහාවංශයේ එම විස්තරයේ සඳහන් වේ. වර්තමානයේ මෙන් ම එකල ද දියුණු සාත්තු සේවිකා ක්‍රමයක් තිබුණු බවට මෙයින් හඳුනාගත හැකියි. මහාවංශ කතුවරයා දක්වන ආකාරයට බුද්ධදාස රජු නිරන්තරයෙන් තමා ළඟ ශල්‍යකර්ම සඳහා යොදා ගන්නා ආයුධ තබාගෙන සිටි බව ද විටෙක ශල්‍ය කර්මයක් කිරීමෙන් රෝගය සුවපත් කිරීමට ද පසුබට
.
ජනතාවගේ රෝගාබාධ සුව විශේෂ සැලකිල්ලක් දක්වා බුද්ධදාස රජතුමා ඔවුන්ගේ හිතසුව පිණිස ගමක් පාසා වෙදහල් පිහිටුවා එහි සේවයට වෛද්‍යවරුන් පත් " ..ඝකාරෙත්වා වෙජ්ජසාලායො වෙජ්ජෙතත්ථ නියොජයි..." (මහාවංශය පරි37 :147 ගාථාව). ඒ අනුව සෑම ගම්මාන එක් ප්‍රධාන වෛද්‍යවරයෙකු බැගින් පත් කොට ඔවුන්ගේ නඩත්තුව සඳහා ගම්මාන වෙන් කොට තිබූ බව ද සඳහන් වේ. එපමණක් නොව එතුමා වෛද්‍ය ශාස්ත්‍රයේ සාරාර්ථය හෙවත් සාරාර්ථ සංග්‍රහය නම් අගනා වෛද්‍ය ග්‍රන්ථය රචනා කරන ලදී. 5වන සියවසේ ලියන ලද විසුද්ධි මාර්ගය නම් ග්‍රන්ථයේ විස්තරයට අනුව ඒ අවධියේ දියුණු ශල්‍ය වෛද්‍ය ක්‍රමයක් පැවති බව පෙනේ.

*සික්ඛන්තෙසු එකො අතිජෙකො වෙගෙන සතතං පාතෙන්තො*
*උප්පල පත්තං ද්විධා වා ජිනදති, උදකෙවා පවෙසෙති අපරො අජෙකො*

> *පීජ්ජන පවෙසනභයා හතථකෙන වුසිතුම්පින විසහති පේකො පන සමෙන පයොගෙන තතථ පදං දස්සෙතථා පරියොදාත සිප්පො හුතථ ා...*" (බුද්ධඝෝෂ හිමි, 1991, 101 පිටුව).

මේ අනුව ශල්‍යකර්ම ඉගෙන ගන්නා දක්ෂතමයා උපුල් පෙත්තක් දිය තලියක බහා එය සැනින් සියුම් ලෙස කපා පෙන්වා තම ශිල්පය නිම කොට ශල්‍යකර්ම පිළිබඳ උපාධිය ලබා ගත් බව පෙනේ. මේ අනුව පැහැදිලි වන්නේ එකල සියුම් පුහුණු කරවන ස්ථාන පවා පැවති බව ය.

එසේ ම ඇතුන් අසුන් ගවයන් වැනි මිනිසාට ප්‍රයෝජනවත් සතුන්ගේ රෝග සුව කිරීම සඳහා පශු ක්‍රමයක් පුරාණයේ පැවති බව පෙනේ. විශේෂයෙන් යුද්ධ කාර්යයන්හි දී ප්‍රයෝජනයට යොදා ගන්නා හස්ති සේනාවට ක්ෂණික ප්‍රතිකාර කිරීම සඳහා දක්ෂ ඇත් වෙදුන් යොදවා තිබූ බව දුටුගැමුණු රජුගේ යුද බිමේ තොරතුරුවල මහාවංසයේ දැක්වේ. එළාර රජුගේ යුද භටයන් විසින් තබන ලද ලෝ දියෙන් තදබල ලෙස පිළිස්සී පීඩාවට පත් කණ්ඩුල ඇතාගේ තුවාල පිරිසිදු කර බෙහෙත් දමා සුදුස පරිදි පිට මත සම් අතුරුවා ඇතු ප්‍රකෘත්තිමත් කර යුද බිමට යැවීමට වෙදුන් සමත් වූ බව 'ඇත් වෙද තෙමේ ලහටු ගල්වා බෙහෙත් කළේ ය' යනුවෙන් මහාවංසයේ සඳහන් වේ. පශු වෛද්‍ය ක්‍රමයේ ද දක්ෂයෙක් වූ බුද්ධදාස රජතුමා ද මහාවංසය සිදුවීම් ගණනාවක් දක්වා ඇත. මහාවංශයේ එන තොරතුරුවලට අනුව එතුමා සතුන්ට වෙදකම් කොට ඔවුන් සුවපත් කර ඇත. එක්තරා විෂඝෝර නාගයකුගේ උදරයේ තිබූ ගෙඩියක් සැත්කමකින් සුවපත් කළ බවත් එයට කළගුණ දකවීමක් වශයෙන් නාගයා රජුට මැණිකක් දුන් බවත් සඳහන් වේ. ඇතුන් හා අසුන්ට වෙදකම් කිරීමට යොදන . එබැවින් එකල පශු වෛද්‍ය ක්‍රමයක් දියුණු ව පැවති බව තහවුරු වේ. බුද්ධදාස රජතුමා අශ්වයෙකුට කළ ප්‍රතිකාරයෙන් සුවය ලද බවත් එය ශිරා චිකිත්සා නමින් පශු වෛද්‍යය ක්‍රමයක් වන බවත් මහාවංශයේ සඳහන් වේ. සතුන්ට පමණක් නොව පක්ෂීන්ට පවා ප්‍රතිකාර කිරීම මහා පරාකමබාහු රජු කපොල්ලේ ගඩක් ඇතිව පැමිණි කපුවෙකුට ප්‍රතිකාර කර සුවපත් කළ ආකාරය කියවෙන මහාවංස පුවතින් පැහැදිලි වේ. එසේ ම මෙකල භික්ෂූන් වෙදකම ඉගෙන ගත් බවත් රෝහල් රෝගවලට පිළියම් කළ බවත් අටුවා ග්‍රන්ථ තොරතුරුවලට අනුව හඳුනා ගත . නමුත් භික්ෂූන් වහන්සේලා එය වෘත්තියක් ලෙස ඉටු කළ කාර්යයක් බව කිව ය. සමන්තපාසාදිකා විනය අටුවාවට අනුව වසභ රජුගේ රෝගී වූ අවස්ථාවක දී රාජ සේවිකාවක් මහාපදුම නම් තෙරුන් වහන්සේ වෙත ගොස් එයට පිළියම් විමසූ බවත් තෙරුන් වහන්සේ එයට පිළිතුරු අසල සිටි භික්ෂූන් සමඟ සාකච්ඡා කරන අයුරෙන් බෙහෙත් ලියා දුන් බවත් සඳහන් වේ (සමන්තපාසාදිකාව, 337පිට). මෙනිසා ඇතැම් අවස්ථාවල රෝගියෙකුට බෙහෙතක් ඇසූ විට ඒ තැනැත්තාට පිළියම කෙලින් ම පිළිතුරු දුන් බව මේ අනුව පැහැදිලි ය. මීට අමතර ව තවත් ප්‍රතිකාර ක්‍රම මෙකල විය. සාහස්සවස්ථුප්පකරණයට අනුව දරුවෙකු ගැබ තුළ මැරුණු අවස්ථාවක ශල්‍යකර්මයක් කර ඉවතට ගත් ආකාරය සඳහන් වේ (සාහස්සවස්ථුප්පකරණය, 2012:136 පිට). එසේ ම එහි උදරවාතයට ගිතෙල් භාවිත කළ බව ද සඳහන් වේ.

මහාවංශයට අනුව බුද්ධදාස රජු සමයේ මෙරට පැවැති ක්ෂේත්‍රයේ දියුණුව ඔහු පුත් දෙවන උපතිස්ස රජු දවස ද පවත්වාගෙන ගිය බව ඔහු විසින් කරවන ලද මාතෘ නිවාස, ආරෝග්‍යශාලා පිළිබඳ වන විස්තර අනුව පැහැදිලි වේ (මහාවංශය, 37පරි,183ගාථා). එනම් අංගවිකල රෝගීන් හා සඳහා භවභෝග සම්පත් ඇති රෝහල් ඇති කළේ ය. මහානාම රජු ද ගිලන්හල් සෑදූ අතර ධාතුසේන රජු ද රෝගීන්ට ප්‍රතිකාර සඳහා ශාලා සෑද වූ බව සඳහන් වේ. දෙවන දප්පුල රජු වෛද්‍ය ශාලාවකුත් පාඬාවියේ වෛද්‍ය ශාලාවකුත් කරවූ බව චූලවංශයේ සඳහන් වේ (මහාවංශය 49 පරි 18-19 ගාථා). එම රෝහල් නඩත්තුව සඳහා නොයෙක් බෝග උපදනා ගම්බිම් වෙන් කළ බව ද එම විස්තරයේ සඳහන් වේ. මේ අනුව විවිධ රජවරුන් විසින් නොයෙක් කාලවල දී විශේෂිත රෝහල් කරවන ලදී. ඒ අනුව හතරවන කාශ්‍යප රජු එකල වසංගත රෝගයක් වූ උපසග්ග රෝගයට අනුරාධපුරයේ හා ආරෝග්‍යශාලා කරවූ බවත් ඒ ඒ තැන ඖෂධ ශාලා කරවූ

බවත් මහාවංශයේ සඳහන් වේ. 5වන කාශ්‍යප රජු ද අනුරාධපුරයේ ආරෝග්‍යශාලා කරවා ඒවායේ නඩත්තුව පිණිස ගම්වල ආදායම යෙදවූ බව සඳහන් වේ. මෙකල . මේ රජුගේ කාලයේ මහ වෙදනා නමින් යුත් නිලධරයෙකු සිටි බව ද මන්ත්‍රණ සභාවේ ටැම් ලිපියේ සඳහන් වේ. ඒ අනුව එහි මහවෙදනා රක් නම් ප්‍රධාන වෛද්‍යවරයෙකු පිළිබඳ දක්වා තිබේ. අග්බෝ රජු තම මෑණියන්ට උපස්ථාන කළ ආකාරය පිළිබඳ සඳහන් ..ඍවහෙතෙම දිවා ර් මෑණියන්ට උපස්ථාන කිරීමෙහි ඇළුනේ විය. උඣීසනම රජ තෙමේ මෑණියන් උපස්ථානයට ගොස් හිස තෙල් ගා ඇඟ දූලි ආදාය උලා නිය ශුධ කොට ආදර සහිත ව නාවා...” යන මහාවංශ විස්තරය අනුව රෝගී උපස්ථානය කෙරෙහි දක්වූ විශේෂ අවධානය පැහැදිලි වේ (මහාවංසය, 73 පරි). සඳහන් මෙම විස්තරයෙන් ගිලන් උපස්ථානයේ දී ගිලනුන්ගේ කායික මානසික ප්‍රබෝධය ඇති වන සේ ක්‍රියා කිරීමේ මහත් ආදර්ශයක් සපයයි. අග්බෝ රජු රාජකීයෙකු වේ. ඔහු තම මව කෙරෙහි වූ සහකම්පනයෙන් මවට උපස්ථාන කරන ලදී. එබැවින් ප්‍රතිපත්ති සම්පාදනයේ දී එය ක්‍රියාවලියක් වුවත් රජු කෙරෙහි සානුකම්පිත වීම මෙකල ක්ෂේත්‍රයේ මහත් දියුණුවක් ඇති වන්නට හේතු වන්නට ඇත. කාශ්‍යප රජුගේ මැදිරිගිරි පුවරු ලිපිය අනුව ද ආරෝග්‍යශාලා පොදුවේ වෙද්හල් වැස්සන් ලෙස . මෙකල නිරෝධාන හා රෝහල් පරිපාලන වශයෙන් . රෝගීන් කෙරෙහි සහකම්පනයෙන් ක්‍රියා කිරීමට ඔවුන්ට හැකියාව ලැබිණි. මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියට අනුව කුඩැල්ලන් යොදා ගෙන ප්‍රතිකාර වෛද්‍යවරයෙකුට ඉඩම් පය දෙකක් ද වසගක් ද ඖෂධ සංයෝජකයෙකුට ඉඩම් කිරි එකක් හා පය දෙකක් බැගින් ද වාර්ෂික දීමනා වශයෙන් ලැබිණි (Paranavitana, 1995: P.89). මෙම ක්‍රමය ආයුර්වේද වෛද්‍යවරුන් විසින් විෂ ලේ ඉවත් කිරීමක් යයි පරණවිතාන මහතා පෙන්වා දෙයි. මෙලෙස ආරෝග්‍යශාලා සේවකයන් පරිපාලන නිලධාරීන් හා වෙදදුරන් ද පාලකයා වශයෙන් රජු ද ගිලන් භික්ෂූන් වැසියන් මෙන් ම සතුන් කෙරෙහි ද සානුකම්පිත ව කටයුතු කරන්නට ඇත.

පුරාතනයේ දී පාලකයන් රාජ්‍යයේ තත්ත්වය පිළිබඳ මහත් සැලකිල්ලට ලක් කළ අතර එය දියුණු කරලීමට රාජ්‍යය ප්‍රතිපත්ති ඒ සම්බන්ධයෙන් ඔවුන් ඉතා උනන්දුවෙන් කටයුතු කර ඇත. මේ සම්බන්ධ වූ ආරෝග්‍යශාලා හා එම ස්ථානයන්ට දෙන ලද දීමනාවක් ගැන දහවන සියවසට අයත් සෙල්ලිපිවලින් අනාවරණය වේ. රාජ සභා ලිපියට අනුව ආරෝග්‍ය ශාලාවකට දෙන ලද බද්දක් පිළිබඳ ව සඳහන් වේ. ...පොලි ය බැනදූ දොති වල ක්නැ කළ වෙදහල ට් හවුරු දු හවුරු දු පතා බද් දට් සාර් අඩමනා ගන්නා ල හසුයෙන් එක් පැළක් සුද්හිගු ර් දි වළදනු කොට් ඉසා සුද්හිගු ර් නොදිය හුණ එක් ලහසුව කට් එක්...” (Paranavitana,1943: P.39). මේ අනුව දොතිවලත් නෑ නමැත්තකු විසින් කරවන ලද ආරෝග්‍ය ශාලාවකට බද්ධ ව අවුරුදු පතා ආයුර්වේදයේ සඳහන් සිද්ධිගුරු හෙවත් වියළි ඉඟුරු බැගින් දුන් බව පැහැදිලි වේ. එසේ ම එකල පරිත්‍යාගශීලී ධනවත් රට වැසියන්ගේ ප්‍රයෝජනය සඳහා ආරෝග්‍ය ශාලා පිහිටුවන ලදී. පස්වන මහින්ද රජු දිවයිනේ සෑම බෙහෙත් වර්ග බෙදා දුන් බවට සෙල්ලිපිවල සඳහන් ය. ඒ අනුව සේනල් නකන් නමැති නිලධාරියෙකු විසින් ප්‍රසූතිකාගාරයක් තනන ලද බවත් එහි නඩත්තුව සඳහා ගම්බිම් ප්‍රදානය කරන ලද බවත් තවත් සෙල්ලිපියක සඳහන් වේ. 4 වන මිහිඳු රජු ද මෙහෙණවරක් අසල රෝහලක් කළ බව සඳහන් වේ. මාතෘ නිවාසවල සාත්තු සේවය සඳහා ස්ත්‍රී පුරුෂ අය යොදවනු . විශේෂයෙන් සාත්තු සේවිකාවන් සේවයේ යෙදෙන බව සඳහන් වන තැන්වල භික්ෂුණීන් ද ගිලනුන්ට උපස්ථාන කිරීමේ ඇත. එය තහවුරු වන්නේ භික්ෂුණී ආරාම අසල පිහිටුවා ඇති වෙදහල් . කුකුරුමහන්දමන ටැම් ලිපියේ මහින්දාරාම නමැති මෙහෙණවරක් අසල පිහිටි වෙදහලක් පිළිබඳ සඳහන් වේ. මේ අනුව රාජ්‍ය ප්‍රතිපත්තීන් හා රාජ්‍ය අනුග්‍රහය ඔස්සේ සියල්ලන්ගේ දායකත්වය සහිත ව පද්ධතිය ඇති බව පැහැදිලි ය. ඒ අනුව මේවා මිහින්තලේ, අනුරාධපුර, , මැදිරිගිරිය ආදී වූ විශාල ආරාමවලට බද්ධ ව පැවති බව එම ස්ථානවලින් හමු වන රෝහල් ඔස්සේ හඳුනාගත (රූප සටහන් 1-4).



**රූප සටහන 01.** අනුරාධපුර මිහින්තලේ පුරාණ රෝහල



**රූප සටහන 02.** අනුරාධපුර මිහින්තලේ පුරාණ රෝහලේ දක්නට ලැබෙන බෙහෙත් ඔරුවක්

මෙකල මධ්‍යස්ථාන අතර ආරෝග්‍යශාලා බෙහෙත් ශාලා හා සූතිකාගාර විය. රජු විසින් හා විවිධ පුද්ගලයන් විසින් මෙම රෝහල් ආරම්භ කළ බවට අභිලේඛන අනුව තහවුරු වේ. පොදු ජනයාගේ යහපත සඳහා ශාලා පවත්වා ගෙන ගිය බවත් ඒවායේ සේවය සඳහා වැටුප් ගෙවන ලද වෛද්‍යවරුන් පත්කර සිටි බවත් සඳහන් වේ. අභා සලමෙවන් රජු කළ ආරෝග්‍ය ශාලාවල සේවය කරන්නන්ගේ වැටුප් වැඩි කළ බව සඳහන් වේ. ශිලා මේඝ නුවරින් බස්නාහිර දිසාවේ වෛද්‍ය ශාලාවක් කර වන ලදී. තුන් වැනි දප්පුල රජු සේවා පහසුකම් ඇති කිරීම සඳහා උනන්දුවක් දැක්වූ බවත් ජනයා කෙරෙහි දයාවෙන් රජු මහා පාණ්ඩ වාපි නම් ගමෙහි ශාලා බව මහාවංසයේ දැක්වේ. ... පුළත්ථි නගරෙ, වාපි වෙජ්ජ සාලා මහාදයො තථාපණ්ඩා වියඤ්ඤව...” (මහාවංසය 47:18ගාථාව). එසේම ඔහු අන්ධයන්ගේ වාසය සඳහා ඒ ඒ තැන ශාලාවන් පිහිටුවන ලද බවත් දෙවැනි සේන රජතුමා ද චෛතියගිරි මිහින්තලා කන්දෙහි ආරෝග්‍ය ශාලාවක් ඉදි කළ බවත් . හතරවන මිහිඳු රජුගේ පුත්‍රයා ගෘහස්ථයන් සඳහා ඇති බවත් රජුගේ සක් සෙනවියා නුවරින්

බැහැර භික්ෂූන් සඳහා ශාලාවක් ලද බව ද සඳහන් වේ. බොහෝ විට භික්ෂුව සඳහා ආරෝග්‍යශාලා ඉදි කිරීමට සිංහල රජුන් ඇත. මහින්ද රජතුමා විශේෂයෙන් ආරණ්‍යවාසී භික්ෂූන්ගේ ලෙඩ දුක් ගැන සොයා බලා නිශ්චිත සේවාවක් වශයෙන් ගිලන් භික්ෂූන් වෙත තම වෛද්‍යවරුන් යවා ප්‍රතිකාර . 4 වන මිහිඳු රජුගේ අභයගිරි ශිලා ලිපියේ ද රෝහලක් ඉදි කිරිම පිළිබඳ දක්වේ ...සෙන් සෙන්සෙනවිරදාණන් ඇතුළ් නුවරැ මඟුල් මහවෙයැ මිහින්ද් අරම් මෙහෙණිවර් පෙරෙට් කැරූ වෙද්හල..." (Paranavitana, 1963: P,22). එපමණක් නොව රෝග නිවාරණය සඳහා භාවිතයට සුදුසු ඖෂධ වශයෙන් ඉඟ, ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි, අරළු, බුළු, නෙල්ලි ආදී වූ බෙහෙත් ද්‍රව්‍යයන් භික්ෂූන්ට ද දුන්හ. කාශ්‍යප රජුගේ උපසග්ග නමින් හැඳින්වෙන රෝගයට ප්‍රතිකාර කිරීම සඳහා අනුරාධපුරයේ සහ ආරෝග්‍යශාලා කරවූ බව සඳහන් වේ. එසේ ම පශ්චාත් අනුරාධපුර යුගය වන විට මැදිරිගිරිය, අනුරාධපුර, මිහින්තලය ආදී ස්ථානවල රෝහල් පැවති බවට පුරාවිද්‍යාත්මක තහවුරු කරයි. මැදිරිගිරි පුවරු ලිපියේ රාජ්‍යය මැදිහත් විමෙන් කරවන ලද රෝහල් තුනක් පිළිබඳ සඳහන් වේ.ඤ ලු...මැඩිලිගිරි රජමහ වෙහෙර්හි ඉසා සෙය්ගිරිපවු රජමහ වෙහෙර්හි ඉසා නුවදෝරහි ඉසා කැරැවු වෙද්හල්හි සියලු සතුන් රොච්බිය හරනට මහවටු පටුනැ සිට රජ කළ සෙන් මහරජහු පුත් මිහින්ද් මහ රජහු...(Paranavitana, 1963: P.29). කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපියෙහි රජු විසින් අනුරාධපුර නුවර මඟුල් මහ වීදියේ නගරයේ දකුණු දොරටුව අසල තනවන ලද රාජකීය රෝහලක් පිළිබඳ සඳහන් වේ (සිරිවීර,2004:271 පිට). දොරබාවිල ටැම් ලිපිය අනුව ද එම රජු විසින් රෝහලකට දෙන ලද ප්‍රදානයන් දක්වා තිබේ. මෙම රෝහල් නේවාසික රෝහල් විය.

**රූප සටහන 03.** අනුරාධපුර යුගයේ කැසිකිළි ගලක්



යුගයේ දී මහා පරාක්‍රමබාහු රජතුමා රට වැසියන්ගේ සෞඛ්‍යය නගා සිටවීම සඳහා විශේෂ උනන්දුවක් දක්වා ඇත. රටවැසියන්ගේ මන්ද පෝෂණය දුරු කරනු සඳහා කාටත් පිරිසිදු කිරි පානය කිරීමට පහසුවන පිණිස දෙනුන් දහස් ගණනක් තැබූ රජ මිනිසුන්ගේ සෞඛ්‍යය රැකගැනීමට වන චිත්ත සන්තුෂ්ටිය ලබා දෙනු සඳහා ප්‍රසිද්ධ දාන ශාලා අවට උයනක් . සියගණන් රෝගීන්ගේ වාසයට සුදුසු ශාලාවක් කරවා එයට අවශ්‍යය සියලු පහසුකම් . සියලු රෝගීන්ට දිවා රාත්‍රී දෙකේ උවමනා ඖෂධ වර්ග හා ආහාර වර්ග සපයනු පිණිස එක් සේවකයෙකු හා සේවිකාවක බැගින් . වෙදකම හෙළ වෙදකම ගැන සැලකිලිමත් වූ බව පෙනේ. රෝග දක්ෂ කෘතහස්ථ වෛද්‍යවරුන් මෙහි සේවය සඳහා යොදවන ලද බව සඳහන් වේ. වළගම්බා රාජ්‍යය කාලයේ ඇති වූ දුර්භික්ෂ තත්ත්වයත් විවිධ වසංගත රෝග හමුවේත් එකිනෙකා සහයෝගයෙන් යුතු ව සහකම්පනයෙන් යුතු ව ක්‍රියා කළ බව පෙනේ. සියවස් ගණනාවක අඛණ්ඩ ඉතිහාසය තුළ රජරට සභ්‍යත්ව

අවධියේ පාලකයන් විසින් උපයෝගිත රාජ්‍යය ප්‍රතිපත්ති සෞඛ්‍යය කෙරෙහි ද ක්‍රියාත්මක කිරීම විධිමත් පාලනයක ස්වභාවය නිරූපිත කරයි. මේ අනුව පැරැන්නන් තළ පැවති තත්ත්වයන් හමුවේ රෝග නිවාරණය සඳහා සාම්ප්‍රදායිකත්වය මත පදනම් වූ රෝග නිවාරණ ක්‍රමවේද රැසක් උපයෝගි කර ගත් බව පැහැදිලි ය. ලාංකේය සමාජය ප්‍රජා සෞඛ්‍යය කෙරෙහි පමණක් නො ව සතුන් කෙරෙහි ද සහකම්පනයෙන් ක්‍රියා කරමින් එම ප්‍රතිපත්තීන් ක්‍රියාවට නංවන ලද බව ද හඳුනා ගත හැකි ය.



**රූප සටහන 04.** කැණීම්වලින් හමු වු ශෛල්‍ය උපකරණ

## 4. නිගමන හා නිර්දේශ

පුරාතන ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදනය රජු කේන්ද්‍ර කර ගත් නිලධාරි මණ්ඩලයකින් සැදුම්ගත් සාමූහික ක්‍රියාවලියක ප්‍රතිඵලයක් විය. රාජ්‍යයේ සුභසිද්ධිය උදෙසා ආගම මුල් කර ගනිමින් සමාජ සහකම්පනය ඇති කිරීමටත් සමාජ ප්‍රගමනය ඇති කිරීමත් සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සිදු කර තිබේ. එලෙස සම්පාදිත ප්‍රතිපත්ති නීතියක් දක්වා ගෙන යමින් සංවිධිත සමාජයක් බිහි කරලීමට ක්‍රියා කළහ. සම්පාදිත බොහොමයක් නීති වශයෙන් ගෙනෙන ලද්දේ ජනයාගේ රාජ්‍යයේ සියල්ලන්ගේ ම යහපත අරමුණු කර ගනිමිනි. නීති මඟින් රාජ්‍ය තුළ සිදු වන අපරාධ අවම කර ගනිමින් ආගමට අනුකූල වූ ධාර්මික සමාජයක් බිහි කරලීම පාලකයන්ගේ අරමුණ විය. රාජ්‍ය ප්‍රතිපත්ති මඟින් උපයෝගිත මෙම නීතිවල දැඩි බවක් පෙන්නුම් කළ ද පාලකයා මුල් කර ගනිමින් මධ්‍ය පාලනයේ සිට ප්‍රාදේශීය පාලනය දක්වා සෑම පුද්ගලයෙකුට ම මෙම නීති පිළිපැදීමට සිදු විය. නීතිය කඩ කළ හොත් ලබා දුන් දඬුවම් වේවැල්කැටිය, බදුලු ටැම් ලිපිය ආදී අභිලේඛනවල මනාව දක්වා තිබේ. මෙම ස්වභාවය මෙකල සමාජයේ සිදු වන අකටයුතුකම් අවම විය. ධර්මානුකූල සමාජයක් එකිනෙකා අතර සබඳතාවයෙන් සහකම්පනයෙන් ක්‍රියා කරන සමාජයක් බිහි විය. පාලකයා පළමු ව වෙත සහානුකම්පිත වීමෙන් ඔහුගේ ආදර්ශය අන් අය වෙත ද බලපාන ලදී. එබැවින් රජු-රාජ්‍ය නිලධාරින්, රජු-භික්ෂූන් වහන්සේලා, රජු-ජනයා, රජු-පරිසරය අතර මනා වූ . විධිමත් ප්‍රතිපත්ති නිසා පාලකයන් දක්වන ලද අනුග්‍රහය නිසා දියුණු පද්ධතියක් එකල සමාජයට හිමි විය. පාරිසරික සම්පත් මනා ලෙස උපයෝගි කර ගැනීම නිසා පාරිසරික බලපෑම් අවම විය. වර්තමානයේ මෙන් නොව මිනිසුන් පරිසරය වෙත සහකම්පනයෙන් ක්‍රියා කළහ. එනිසා සමාජ සහකම්පනය ඇති කිරීම උදෙසා සම්පාදිත ප්‍රතිපත්ති ප්‍රතිපත්තියක් ලෙස ක්‍රියාත්මක කිරීමත් නිසා සාර්ථක පාලන රටාවක් සංවිධිත සමාජයක් රජරට සභ්‍යත්ව

අවධිය තුළින් වන බව කිව හැකි ය. අතීතය තුළින් වර්තමාන ගැනීමේ දී මෙම සහානුභූති සංකල්පයෙන් මනා වූ ආදර්ශයක් සපයයි.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


අමරවංස නාහිමි, අකුරැස්සේ සහ හේමචන්ද්‍ර දිසානායක, (1994), වංසත්තප්පකාසිනි (සිංහල), කැලණිය

ගම්ලත්, සුචරිත සහ වික්‍රමසිංහ, ඊ. ඒ. (සංස්.), (1996), සිංහල සමන්තපාසාදිකා (බාහිර නිදාන) කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ

පියරතන හිමි, බද්දේගම, සෝරත හිමි, වැලිවිටියේ සහ රතනසාර හිමි, සිරි සුමංගල (සංස්.),(2012), සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා දෙහිවල. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

බුද්ධඝෝෂ හිමි, (1991), විසුද්ධිමග්ග, බෞද්ධ ප්‍රකාශන සංගමය

විමලජෝති හිමි, කිරම, (2003), මහාවංශය (සිංහල), (සංස්.), දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

සිරිවීර, ඉන්ද්‍රකීර්ති, (2004), "පුරාතන ලංකාවේ සෞඛ්‍යය හා ස්වස්ථතාව," අනුමෝදනා, සෝමතිලක, එම් සහ එච්.එම්.ඩී.ආර්.හේරත් (සංස්), කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

Codrington, H. W and Wickramasinghe, D. M. Z. (ed), (1994), Epigraphia Zeylanica, Vol.3, Archeological Survey of Ceylon

Paranavitana, Z. S. and Codrington, H. W (ed), (1995), Epigraphia Zeylanica, Vol;1, New Delhi: Asian Educational Services

Paranavithana, S., (1970), Inscriptions of Ceylon, Vol. I, Colombo : Department of Archaeology

Paranavitana, S. (1943), Epigraphia Zeylanica (1934-1941) Vol;IV,Publisher: Colombo : Government of Humphrey Milford

Paranavitana, S., Godakumbura, C. E. (eds.), (1963), Epigraphia Zeylanica Vol. V. Pt. 2, Archaeological survey of Ceylon

Wickramasinghe, D. M. Z. (ed), (1928), Epigraphia Zeylanica, Vol;2, : Oxford University Press

Wickramasinghe, D. M. Z. and Codrington, H. V. (1933), Epigraphia zeylanica Vol; 111, Colombo : Government of Humphrey Milford.